## මානව මහිම

### කාලය මැනීම

# ඔරලෝසුව

පැය යත කාල ඒකකය පළමුවෙන් නිර්මාණය කළේ ඊජිප්තු ජාතිකයන්. ඔවුන් දවල් වරුව පැය 12 කට බෙදා වෙන් කළා. හිරු තැටියක ආධාරයෙන් තමයි මේ ඊජිප්තු ජාතිකයන් කාලය මැන්නේ. ඒ ක්‍රි. පූ. 4000 තරම් ඈත අතීතයේ. හිරු තැටියේ දණ්ඩක් වූ අතර හිරු ගමන් කරන විට දණ්ඩේ හෙවණැල්ලේ දිග ප්‍රමාණය හා ස්ථානය වෙනස් වුණා. ඒ අනුව වෙලාව පැවසීමට හැකි වුණා.

හිරු එළිය නැති වෙලාවල හෝ දිනවල වෙලාව බැලීමට ජල ඔරලෝසුව බිහි වුවා. ඉහළ ඇති බඳුනක සිට පහළ ඇති බඳුනකට ජලය නිශ්චිත ප්‍රමාණයක් වැටීමට යන කාලය මැනීමයි මෙහිදී සිදු වුණේ. පැ තැටිය බිහිවූයේ ද මේ මූලධර්මය ඔස්සේ යි. පැ තැටිය කොටස් දෙකකින් යුක්ත වූ අතර වැලි පුරවා තිබුණා. ඉටිපන්දම් දැවීම මගිනුත් කාලය මැනීම සිදු කෙරුණා. ඉටිපන්දම කොටස් 12 කට බෙදා එක කොටසක් දැවීමට ගත වන කාලය පැයකට සමාන කළා. ඒත් මෙය එතරම් සාර්ථක ක්‍රමයක් වූයේ නැහැ.

### යාන්ත්‍රික ඔරලෝසුව

ප්‍රථම යාන්ත්‍රික ඔරලෝසුව 1250-1300 අතර කාලයේ දී යුරෝපයේ බිහිවූ බවට මතයක් පැවතියත් බ්‍රිතාන්‍ය විශ්වකෝෂයට අනුව නම් ප්‍රථම යාන්ත්‍රික ඔරලෝසුව මහජන ප්‍රදර්ශනයට ඉදිරිපත් කොට ඇත්තේ 1335 දියි. ඒ මිලාන් නුවර දී ය.

දැනට පවතින පැරණි ම ඔරලෝසුව 1386 දී නිපදවා එංගලන්තයේ සැලිස්බරි දේවස්ථානයේ එල්ලා ඇති ඔරලෝසුව යි. එය තවමත් ක්‍රියාකාරීව පවතිනවා.

### බට්ටා ඔරලෝසු

1655 දී ඕලන්ද විද්‍යාඥයකු වූ ක්‍රිස්ටියන් හයිජෙන්ස් බට්ටා ඔරලෝසුව නිපදවූවා.

කාලය මැනීමට අවලම්බය භාවිතා කළ හැකි බව මුලින්ම පෙන්වා දුන්නේ ගැලීලියෝ ගැලිලි වුවත් හයිජන්ස් ක්‍රියාත්මක වනතුරුම ඒ ගැන කිසිවෙක් උනන්දු වී තිබුණේ නැහැ.

### ලොකුම ලී ඔරලෝසුව

ලොව ලොකුම ලී ඔරලෝසුව ඇත්තේ ජර්මනියේ ඩිග්බර්න්ස්හි සංචාරක නිකේතනයක ය.

මේ ලී ඔරලෝසුව මීටර් 30 උස වන අතර මෙහි නිර්මාතෘ ජෝශප් වෝල්ඩ් නැමැත්තෙකි.



බිග් බෙන්

### බිග්බෙන්

ක්‍රි. ව. 1834 දී ලන්ඩනයේ මහ ගින්නක් ඇති වී එහි පාර්ලිමේන්තු මන්දිරය දැවී විනාශ වුණා. එය නැවත ගොඩ නගද්දී මන්දිරයේ හොඳ මට්ටමේ ඔරලෝසුවක් නිර්මාණය කරන්නට ද එවකට වැඩ දෙපාර්තමේන්තු ප්‍රධානියාව සිටි බෙන්ජමින් හෝල් කල්පනා කළා. ඒ අනුව වසර දෙකක කාලයක් තුළ මේ ඔරලෝසුව ඉදි වුණා. මේ ඔරලෝසුවේ මුහුණතක පළල අඩි 22 ක් වුණා. ඔරලෝසු කණුවෙ උස අඩි 316 ක්. පැය කටුව දිග අඩි 9 යි. මිනිත්තු කටුව දිග අඩි 14 යි. එක් කටුවක බර හොණ්ඩර දෙකයි.

මේ ඔරලෝසුවට බිග්බෙන් නම ලැබීම ද රසවත් කතාවක්. ඔරලෝසුව සෑදීමෙන් පසු එයට නමක් තැබීමට අවශ්‍ය වුණා.

මෙහිදී ඇතිවූ විවාදයට බෙන්ජමින් මහතාත් පැමිණ සිටියා. ඔහු හුගක් මහත කෙනෙක්. ඔහුට උපහාර පිණිස 'බිග් බෙන්' ලෙස නම් කරමුයි එක් මන්ත්‍රීවරයෙක් යෝජනා කළා. පසුව එය ස්ථිර වුණා.



මල් ඔරලෝසුවක්

### මල් ඔරලෝසුව

ජර්මනියේ ෂිටවු නුවර ඇති මේ මල් ඔර්ලෝසුව මත මල්පැළ 4800 පමණ වගා කොට තිබේ. ❑

**කතාව : මනෝජ්**
**චිත්‍ර : කුසල ජයරත්න**